**යාපනය මහා නගර සභාව**

**යාපනය දිස්ත්‍රික්කය**

-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 12 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1:2 මතය
------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව, යාපනය මහා නගර සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට යාපනය මහා නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3:1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණ.

1.3:2 ගණුම්කරණ අඩුපාඩු
-----------------------

ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම්වලට අදාලව ගිණුම්වල නිරීක්ෂණය වූ අඩුපාඩු අවස්ථා ගණන හා වටිනාකම් යටතේ පහත වගුවෙහි දැක්වේ.

| | ආදායම් | | වියදම් | | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | - | රු. | | රු. | | රු. |
| ගිණුම්වල වැඩියෙන් දැක්වීම් | - | - | 04 | 890,627 | 01 | 86,463,089 | - | - |
| ගිණුම්වල අඩුවෙන් දැක්වීම් | 01 | 151,256 | 01 | 1,040,332 | - | - | - | - |
| ගිණුම්වලින් අත්හැරීම් | - | - | 01 | 647,238 | 01 | 14,417,581 | 03 | 145,173,819 |

### 1.3.3 බැංකු සැසඳුම්

අ සභාවේ බැංකු ගිණුම් පහකට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් පැවති බව නිරීක්ෂණය විය.

ආ මුදල් රෙගුලාසි 189 හා 486 නියමයන් ප්‍රකාරව රු.46,000 ක් වටිනා අගරු චෙක්පතක් පිළිබඳව කටයුතු කර නොතිබුණි.

ඇ නිකුත් කළ දින සිට මාස 06 කට වැඩි කාලයක් ඉක්මවූ රු.833,425 ක් වටිනා චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව විධිමත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

### 1.3.4 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 කට වැඩි කාලයක් ඉක්මවා තිබ ගෙවිය යුතු ගණුම් ශේෂවල වටිනාකම රු.71,511,683 ක් විය.

### 1.3.5 බලය නොලත් ගනුදෙනු

වැටුප් හා වේතන ගෙවීමට සහ වෙනත් කාර්යයන් සඳහා ගෙවීමට ස්ථාවර තැන්පතුවලින් රු.5,478,358 ක මුදලක් සභා අනුමැතිය නොමැතිව ආපසු ගෙන තිබුණි.

### 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

#### (අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2011 ජූනි 30 දිනට විගණන විමසුම් 12 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විගණන විමසුම්වලට අදාල ගනුදෙනුවල ගණනය කළ හැකි වටිනාකම රු.10,796,436 ක් විය.

(ආ) තොරතුරු ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා වටිනාකම රු.1,572,615 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.7 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) මහා නගර සභා ආඥාපනත (252 අධිකාරය) | |
| (i) 247 (අ) වගන්තිය | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව හෝටල් 5 කින් රු.44,600 ක් වූ බලපත්‍ර ගාස්තු සභාව විසින් අයකර ගෙන තිබුණි. |
| (ii) 218 වගන්තිය | 2010 වර්ෂය සඳහා පරිපාලන වාර්තාව සභාවට ඉදිරිපත් කර නොතබුණි. |
| (ආ) උතුරු පළාත් මුදල් රෙගුලාසි | |
| මූල්‍ය රීති 433 | වාහන නමයක ධාවන වාර්තා හා මාසික කාර්ය සාධන සාරාංශ සභාව විසින් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| මුදල් රෙගුලාසි 571 | විවිධ තැන්පතු ගිණුමේ පැවති රු.7,919,918 ක් වු ඉකුත් තැන්පතු මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉවත් කර නොතිබුණි. |

(ඇ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත

153 වගන්තිය — සැපයුම්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් රු.108,616 ක් වූ රඳවා ගැනීම් බදු අයකර නොතිබුණි.

(ඉ) අංක 17/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය — චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව නැවත සේවයේ යොදවන ලද කාර්ය මණ්ඩලයට ජීවන වියදම් දීමනා රු.164,371 ක් ගෙවා තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.751,253 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.30,405,278 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම්, පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු | 13,553 | 15,114 | 26,348 | 13,114 | 15,918 | 29,049 |
| බදු කුලී | 19,840 | 23,975 | 2,165 | 17,765 | 19,806 | 3,000 |
| බලපත්‍ර ගාස්තු | 3,213 | 5,054 | 7,578 | 3,082 | 2,706 | 7,954 |
| වෙනත් ආදායම් | 357,429 | 287,110 | 37,712 | 284,027 | 251,028 | 1,830 |

2.2.2 උසාවි දඩ මුදල්

-----------------

විවිධ ආඥා පනත් යටතේ යාපනය මහේස්ත්‍රාත් අධිකරණය විසින් රැස් කර 2010 දෙසැම්බර් 31 දක්වා ප්‍රධාන ලේකම් වෙත ප්‍රේෂණය කරන ලද රු.2,271,383 ක් වූ උසාවි දඩ මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2:3 මුද්දර ගාස්තු

---------------

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන් මුද්දර ගාස්තු ලෙස ලැබිය යුතු රු.33,036,632 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.4 අයකර ගත යුතු ආදායම්

----------------------------

(අ) මහ නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 254 (අ) (1) සහ (2) වගන්තිය ප්‍රකාරව 2010 දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂයට අදාල හිඟ වරිපනම් බදු, බදුකුලී, බලපත්‍ර ගාස්තු සහ වෙනත් ආදායම් රු.73,803,080 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 ජනවාරි සිට දෙසැම්බර් දක්වා යාපනය මහා නගර සභාව විසින් බිල් කරන ලද වරිපණම් බදු රු.7,502,717 ක් වූ අතර, 2010 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු.23,924,982 ක් විය. මෙම හිඟ මුදල්වලින්, රජයෙන් සහ රජයට අනුබද්ධිත ආයතනවලින් ලැබිය යුතු මුදල රු.392,154 ක් විය.

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරයේ ලියාපදිංචි වූ හා සභා පාලනයට යටත් ප්‍රදේශයෙහි පිහිටා ඇති හෝටල්වලින් උපයන ලද ආදායමෙන් 1% ක බදු අයකර ගැනීමට මහ නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 247 (අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3 වියදම් ව්‍යුහය

---------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම සහ විචලනය පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 අයවැයගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 අයවැයගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| පුනරාවර්තන වියදම | | | | | | |
| පුද්ගල පඩිනඩි | 327,085 | 266,405 | 60,680 | 257,483 | 222,707 | 34,776 |
| වෙනත් | 49,762 | 65,600 | (15,838) | 44,794 | 36,345 | 8,449 |
| උප එකතුව | 376,847 | 332,005 | 44,842 | 302,277 | 259,052 | 43,225 |
| ප්‍රාග්ධන වියදම් | 21,387 | 26,892 | (5,505) | 34,102 | 30,218 | 3,884 |
| මුළු එකතුව | 398,234 | 358,897 | 39,337 | 336,379 | 289,270 | 47,109 |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මණ්ඩලික මට්ටම | 30 | 23 |
| ද්විතියික මට්ටම | 219 | 164 |
| ප්‍රාථමික මට්ටම | 974 | 761 |
| වෙනත් | - | 422 |
| එකතුව | 1,223 | 1370 |

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

ආයතන සංග්‍රහයේ 2.1 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු සීමිත කාලයක් සඳහා රාජකාරියට වාර්තා නොකරන අවස්ථාවක එම තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා ඒ වෙනුවට නිලධාරීන් සේවයේ යෙදවිය හැක. එසේ වුවද, මහා නගර සභාව විසින් අනුමත සංඛ්‍යාවට බාහිරව සේවකයන් 408 දෙනෙකු බඳවාගෙන වර්ෂය තුළ සේවයේ යොදවා එකතුව රු.40,790,592 ක මුදලක් ඔවුන්ට වැටුප් ලෙස ගෙවා තිබුණි.

2.5 වත්කම් කළමනාකරණය
-----------------------------

2.5.1 ලැබිය යුතු ගිණුම්
-------------------

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ රු.5,229,556 ක් වූ අතර වර්ෂ 01 කට වැඩි කාලයක් ඉක්මවා තිබ ගිණුම් ශේෂ එකතුව රු.3,160,638 ක් විය.

2:5:2 අයවීමට ඇති සේවක ණය
-----------------------------

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය ශේෂවල එකතුව රු.19,398,220 ක් වූ අතර වර්ෂ 01 කට වැඩි කාලයක් ඉක්මවා අයවීම් හිඟ හිරි ශේෂ එකතුව රු.37,014 ක් විය.

2:5.3 අචල ජංගම වත්කම්
----------------------

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 කට වැඩි කාලයක් ඉක්මවා පැවතුණ අචල ජංගම වත්කම් වටිනාකම රු.2,505,084 ක් විය.

2.5:4 සමීක්ෂණය නොකළ වත්කම්
-------------------------------

සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණනය කරන ලද වත්කම්වල වටිනාකම රු.103,019,028 ක් විය.

2:6 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත භෞතික සම්පත්
---------------------------------------------------

(අ) භාණ්ඩ හා උපකරණ 200 කට වැඩි ප්‍රමාණයක වර්ෂයකට වැඩි කාලයක් භාවිතා කිරීමෙන් තොරව පැවතුණු අතර, ඒවා අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. එම භාණ්ඩ හා උපකරණවල වටිනාකම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ට්‍රැක්ටර් හා ට්‍රේලර් ඇතුළත් සභාවේ වාහන 07 ක් ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණු අතර, එම වාහන වර්ෂ 05 කට වැඩි කාලයක් ධාවනයට යොදා තිබුණි.

2.7 හඳුනා ගත් පාඩු හා හානි

-----------------------------

සභාව විසින් පවත්වා තිබුණු තොරතුරුවලට අනුව සහ විගණන නියැදි පරීක්ෂණවලට අනුව පාඩු හා හානිවල වටිනාකම රු.14,651,217 ක් විය.

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අත්තිකාරම් ලේඛනය අනුව 1995 සිට 2010 දක්වා නිරවුල් නොකළ අත්තිකාරම් රු.7,507,004 ක් විය. මෙයින් රු.2,271,448 ක් වූ අත්තිකාරම්වලට අදාලව අයකරගත යුතු පාර්ශ්වයන් හඳුනාගෙන නොතිබුණි.

(ආ) සභාව මගින් පවත්වාගෙන යන ගවඝාතක ස්ථානය සඳහා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හා 2000 නොවැම්බර් 22 දිනැති අංක 1159/22 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. ගව ඝාතක ආඥා පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඝාතනය කරනු ලබන ගවයින් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලියාපදිංචි කර නොතිබුණි.

(ඇ) වීථි ලාම්පු නඩත්තු කිරීම

-----------------------------

සභා බල ප්‍රදේශය තුළ වීථි ලාම්පු 4200 ක් සවි කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2010 වර්ෂයේදී අනුමත කර තිබුණි. එහෙත්, 2010 ජූනි මස කරන ලද සමීක්ෂණයට අනුව, අනුමත සීමාව ඉක්මවා වීථි ලාම්පු 1300 ක් සවි කර තිබුණු බව අනාවරණය විය. අනුමැතිය නොලත් වීථි ලාම්පු සවිකිරීම නීත්‍යානුකූල කිරීමට ලංකා විදුලි බල මණ්ඩලයෙන් ඉල්ලීමක් කිරීමට පියවර ගෙන නොතිබුණු අතර, වීථි ලාම්පු නඩත්තු කිරීම සඳහා දරන ලද වියදම වැඩි වී තිබුණි. සභා බල ප්‍රදේශය තුළ වීථි ලාම්පු නඩත්තු කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණු අතර, 2010 වර්ෂය තුළදී නඩත්තුව සඳහා සභාව විසින් රු.360,000 ක වියදමක් දරා තිබුණි.

2.9 කාර්ය සාධනය
------------------

සභාව විසින් ගිණුම් වර්ෂය අරම්භයේදී වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එබැවින් ඉටු කර ගත යුතු අපේක්ෂිත අරමුණු හා ඒ පිළිබඳ ප්‍රගතය තහවුරු කරගත නොහැකි විය.

2.10 අභ්‍යන්තර විගණනය
-----------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන
-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) අයවැය පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) විවිධ තැන්පත්
(ඊ) වත්කම් කළමනාකරණය
(උ) මෝටර් වාහන උපයෝජනය
(ඌ) ප්‍රධාන හා පරිත්‍යාග